


# යොවුන් විය නිවැරදිව හඳුනා ගන්න

**අප සමාජය යොවුන් විය හඳුන්වන්නේ කුණාටු සමයක් වශයෙනි. මෙම නව යොවුන්විය සංකල්පය මෑත යුගයේ දී සංවර්ධනය වූවකි. මෙය මනෝවිද්‍යා ක්ෂේත්‍රය මුල්කරගෙන ඇති වූවක් වන නමුත්, අධ්‍යාපනික, වෛද්‍ය විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, සංස්කෘතික හා සදාචාරාත්මක ක්ෂේත්‍රයන් මඟින් මෙම සංකල්පය වැඩි දියුණු වී පවතී.**

වෘත්තීය මනෝවිද්‍යා උපදේශිකා
**චාන්දිමා මූනමලේ ඈපා**

21 වැනි සියවසට පා තගා ඇති අප සමාජයේ බහුතරය මෙම නව යොවුන් විය හරියාකාරව හඳුනාගෙන නැති බව නම් පැහැදිලිය. උපදේශනයට යොමු වී තිබෙන ගැටලු දෙස බැලූවිට එවැනි හැඟීමක්වත් ඔවුන්ට ඇත්දැයි ප්‍රශ්නයකි. තමන්ට අවශ්‍ය පරිදි පාලනය කරමින් ළමයා නව දූරටත් තම අණසකට යටත්ව පවත්වාගෙන යාමට වැඩිහිටි සමාජය උත්සාහ ගන්නා බව පෙනෙයි.

මේ නිසා යෞවනයා පීඩා විඳියි. දෙමාපියන්, ගුරුවරුන්, වැඩිහිටියන් ඇතුළු සමාජ බහුතරය නව යොවුන් විය මැනවින් තේරුම් ගන්නා තුරු නව යෞවනයන්ට මෙම වියේ ඇති සංකීර්ණ බවින්, පීඩනයෙන්, අසහනයෙන් මිදීමට නොහැකි වේ. ඔහුට / ඇයට නව දූරටත් මෙය කුණාටු සමයක් වේ.

මිනිසා පටන්ගත්ද සිටම නව යොවුන් විය පවතින්නට ඇතත්, එය ගත කළ යුතු ආකාරය කාලයා විසින් වෙනස්කර ඇති බව නම් පැහැදිලිය. එද සුවිශේෂී සමයක් නොවූ නව යොවුන් විය අද වන විට කුණාටු සහිත පීඩාකාරී අවධියක් බවට පත්වී ඇත්තේ සමාජ විපර්යාසයන් නිසාමය. අදටත් ගෝත්‍රික සමාජවල සහ අඩු ආදායම් ලබන සමහර පවුල්වල නව යෞවන වයසක් නැත. ළමා විය අවසන් වන විටම කිසිදු බාධාවකින් තොරව වැඩිහිටි වගකීම් බාර ගැනීම ගෝත්‍රික ජනතාව අතර සිදු වේ. මේ නිසා නූතන තරුණයන්ට මෙන් අර්බුදකාරී ගැටුම් සහිත පරිවර්තන සමයක් ඔවුන්ට නැත.

නව යොවුන් විය දෙවන ළමා වියක් ලෙස ද හඳුන්වයි. මේ කාලය පුද්ගල සංවර්ධනයට ඉතාම වැදගත් කාල පරිච්ඡේදයක් වන්නේ නම් මේ කාලය තුළ ක්ෂණික ශාරීරික හා ලිංගික සංවර්ධනයක් ඇතිවන නිසාත් එමඟින් මානසික හා චිත්තවේගීය වශයෙන් ක්‍රමයෙන් පරිහානිය කරා වැඩෙන යුගයක් වන නිසාත්ය. තමන්ගේ මතිමතාන්තර ගොඩනගා ගනිමින් ස්වාධීන පුද්ගලයකු වශයෙන් වැඩීම අරඹන්නේ මේ අවධියේයි. මෙම වයසේ දරුවන් තුළ තර්ක කරන චින්තන ස්වාභාවයක් පවතී. සීඝ්‍ර ප්‍රජනන (බුද්ධිමය) වර්ධනයක් ඇති වේ. නමුත් තවමත් ආත්මකේන්ද්‍රිය වේ. (තමන් ගැන වැඩිපුර සිතයි) තම මතය හරි හෝ වැරදි හෝ වේවා එහිම එල්බගෙන තර්ක විතර්ක කරයි. උපකල්පනයන් ඇතිකර ගනී. සිදුවිය හැකි ලෙස එසේ සිදු නොවූ දෙයක් සිතිය හැකි වේ. වැඩිහිටියන් මේ ගති ස්වාභාවයන් අවබෝධ කර ගත යුතුය. 'මම නම් මේ අසාධාරණයට හරිම විරුද්ධයි" නව යොවුන් වියට පා තබා සිටින දරුවාගේ ආකල්පයම වෙනස පිළිගැනීමට මව්පිය, ගුරුවරුන් එකඟ නොවීමෙන් ගැටලුව නව නවත් උග්‍ර විය හැකියි.

නව යෞවන වයසේ දී ළමයා නව දූරටත් ළමයකු නොවන අතර වැඩිහිටියකු ද නොවේ. ළමා ගති ඉවත්කර ගනිමින් වැඩිහිටි චර්යාවන්ට හුරු වීමට නව යෞවනයා උත්සාහ දරයි. මොවුන්ට සමාජ පිළිගැනීමක් නොතිබුණත් ළමා ගති පැවතුම් මෙන්ම මුහුකුරා ගිය පැවතුම් ද සමාජය විසින් අපේක්ෂා කරයි. "මේ ළමයාට දැන් අවු 15 ක් වුණාට මොකද තවම බෑ ලූණු ගෙඩියක් සුද්ද කර ගන්න...." තේ එකක් හදන්න.. ගෙයක් අතුපතු ගාන්න ඔහොම ඉඳල කොහොම ද ? තවම පොඩි ළමයෙක් වගේ සෙල්ලම් කර කර හිටියම හරියයි ද ? පස්සේ කාලෙක මට තමයි ඕවට බැනුම්



අහන්න වෙන්නේ " දියණියගේ ළමා ගති දකින මවගේ චෝදනාව මෙසේ වුවත්, තවත් අවස්ථාවක දී ඇය දරුවාගෙන් අපේක්ෂා කරන්නේ ළමා ගතිගුණයන්ම නොවේ ද " ජේනවා තේද කියවන නවකතාවල තරම, ලොකු අය කියවන පොත් මොනවට ද ළමයි කියවන්නේ ? අඳින්නේ පළඳින්නෙත් අලුත්ම විලාසිතාවලට ... දූවගේ වයසේ හැටියට නෙමෙයි දූන් වැඩ" මෙසේ පරස්පර විරෝධී චෝදනාවන්ට ලක්වන දරුවා දෙගිඩියාවට පත්වේ. "අම්මට මම කෝක කළත් වැරදියි" යනුවෙන් ඇය සිතන්නටත් කියන්නටත් පටන් ගන්නේ මෙසේ වූ විටයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව මෙම වයස් පරතරය අවු 10 – 19 වන අතර විවිධ විද්‍යාඥයන් විසින් මෙම කාලසීමාව සුලු වශයෙන් වෙනස්කර පෙන්වා ඇත. ඉංග්‍රීසි බසින් Adolesance ලෙස හඳුන්වන මෙම කාලය ලතින් බසින් බිඳී ආ "**පරිණතිය කරා වර්ධනය වීම**" යන අර්ථය ඇති පදයකි. මිනිසාගේ උපතේ සිට පළමු පස් වසර තුළ ශාරීරිකව වර්ධනය වේ. ඉන් පසු එම වර්ධන වේගය බාල්වන අතර යොවුන්වියේ දී ප්‍රබල පරිවර්තනයන්ට බඳුන් වේ. සමස්ථ පෞරුෂ පරිණතියක් මෙකල සිදුවන අතර එය ශාරීරික, ලිංගික, බුද්ධිමය මානසික හා සමාජමය වශයෙන් වෙන්කර දක්විය හැකි ය. නූතන සමාජයේ නව යොවුන් විය දිගු කාලයකි. ඊට හේතු වී ඇත්තේ සමාජ සංකීර්ණත්වය නිසා ළමයාගේ ඇතුළතින් වන ශාරීරික හා ලිංගික පරිණතියට සමාන්තරව චිත්තවේගික හා සමාජමය සාධක අනුවත් වෙනත් සංස්කෘතික ලක්ෂණ අනුවත් මෙම කාලය දීර්ඝ වී විවිධ වී තිබීමයි. අප රටේ නම් ආර්ථික ස්වාධීනත්වය ලැබ යුග දිවියට එළඹෙන තුරු වැඩිහිටියකු නොවන බව සලකයි. එය සමාජ පංතිමය ස්වරූපය අනුවත් වෙනස් වේ. අඩු ආදයම් සහිත ගොවි කම්කරු ජනතාවගේ දරුවන් ඉක්මනින් ආර්ථික ස්වාධීනත්වය ලැබ ජීවිත වගකීම් බාර ගනී. මධ්‍යම පංතියට අයත් ජනතාවගේ දරුවන් ඉහළ අපේක්ෂන නිසා පාසල් හා පුද්ගලික උපකාරක පංතිවල සහාය පතමින් වැඩිහිටියන් මත යැපේ. මේ නිසා දීර්ඝ කාලීන යෞවන අවධියක් ගත කරයි. ඉහළ ආදයම් ලබන පවුල්වල දරුවන් මේ දෙයාකාරයටම යොමුවන බව පෙනේ.

උපදේශනය සඳහා පැමිණි සමන් දිගින් දිගටම තම මවටත් පියාටත් තේරුම් ගත නොහැකි තමාගේ දර්ශනය පිළිබඳ තර්ක කරමින් පැහැදිලි කළේ ය. ඔහු පවසා සිටියේ "කිසි කෙනකුට මේවා කියලා වැඩක් නෑ... කාටවත් තේරුම් ගන්න බෑ.. මාව පිස්සෙක් කියලා හිතයි. මම කියන්නේ මේ කරන කිසිම දේක තේරුමක් නැහැ කියලයි. මම එකම ආගමක්වත් අදහන්නේ විශ්වාස කරන්නේ නෑ... මට ඕන කරන්නේ කවුරුත් නැති තැනකට ගිහින් හුගාක් දේවල් ගැන හිතන්නයි. ඒත් මම කියන දේ අම්මලාට තේරුම් ගන්න බෑ... යනාදී වශයෙනි. අ.පො.ස. (සා/පෙළ) විශිෂ්ට සම්මාන ලැබූ තම එකම දරුවාට මානසික රෝගයක් වැළදෙන්නට යනවාදැයි මව්පියන් බියවී සිටී. මෙවැනි නොයෙක් විශ්වාස මත ඇදහිලි වැනි දේ පිළිබඳ නව යෞවනයා තර්ක කරයි. ඔහුට / ඇයට එහි හරි වැරැද්ද යථාර්ථවාදීව පැහැදිලි කළ විට එවැනි දේ තේරුම් ගැනීමට ඔවුන් බුද්ධිමත් වේ.

පරමාදර්ශ අනුගමනයට පෙළඹීම ද මෙම වයසේ ලක්ෂණයකි. නළුවන්, ගායකයින්, ක්‍රීඩකයින්, මව්පියන්, ගුරුවරුන් අනුකරණයට පෙළඹෙයි. ඔවුන් තම ලෝකයේ වීරයින් ලෙස සලකයි. ඒ අය සිටින තත්ත්වයට ළගාවීමට උත්සාහ කරයි. මෙය වීරාභිවන්දනය (Hero Worshiping) ලෙස හඳුන්වයි.

යමක් නිවැරදි කර ගැනීමට වෙනස් කර ගැනීමට අවශ්‍ය විටෙක අතීත සිතුවිලි මතකයේ තබාගෙන සිට ප්‍රයෝජනයට ගත හැකි වීම තවත් ලක්ෂණයකි. යමක එකම පැත්තක් නොව, තවත් පැත්තක් තිබිය හැකි බව තේරුම් ගනී. දෙමාපියන්, පවුලේ සාමාජි

උපදේශනය සඳහා පැමිණි සමන් දිගින් දිගටම තම මවටත් පියාටත් තේරුම් ගත නොහැකි තමාගේ දර්ශනය පිළිබඳ තර්ක කරමින් පැහැදිලි කළේ ය. ඔහු පවසා සිටියේ "කිසි කෙනකුට මේවා කියලා වැඩක් නෑ... කාටවත් තේරුම් ගන්න බෑ.. මාව පිස්සෙක් කියලා හිතයි. මම කියන්නේ මේ කරන කිසිම දේක තේරුමක් නැහැ කියලයි. මම එකම ආගමක්වත් අදහන්නේ විශ්වාස කරන්නේ නෑ...



කයත්, ගුරුවරුන්, මිතුරන් ආදී තමා අවට සිටින අයට මෙන්ම ඉන් පිටස්තර සමාජයටද සාධාරණත්වය සිදුවන පරිදි සිතයි. තම අතීත සිතුවිලි චින්තනය දෙස ආපසු හැරී බලා හරි වැරදි බව සාධාරණ බව යළි සලකා බැලිය හැකි වේ. තර්කානුකූලව විද්‍යාත්මකව සිතීමට පෙළඹේ. තමා ඉදිරිපිට දකින සෘජු අත්දැකීම්වලින් ඔබ්බට සිතයි. වෙනස්වන තත්ත්වයන්, සිදුවිය එකි /සිදුවිය යුතු වෙනස්කම් ගැන සිතයි. විවිධ සාධක සලකා බලා නිවැරදි තීරණ ගැනීමට පුලුවන.

ළමයාගේ මේ බුද්ධිමය වෙනස නිසා තමන්ට හසුවන, දකින, මුණගැසෙන සියලු දේ විමර්ශනයට තර්කානුකූල චින්තනයට යොදා ගනී. මෙතෙක් නිහඬව වැඩිහිටි අදහස් (හරි / වැරදි වේවා ) පිළිගත් ළමයා දැන් තර්කානුකූලව විමසන බව අවබෝධ කරගත යුතුය. මෙම බුද්ධි ප්‍රබෝධය විෂය මාලාවට සීමා විය යුතු බව ගුරු දෙමාපියන් සිතුවත් එය එසේ නොවී පාසලේ නිවසේ කටයුතුවලටට ද බලපායි. දැන් ළමයා පාලනය කරනු වෙනුවට අවබෝධයෙන් ක්‍රියා කළ යුතු වේ. වැඩිහිටියා හා ළමයා අතර ගැටුම් ඇති වීමට හේතුවන්නේ එවැනි අවබෝධයක් නැතිකමයි. මෙම බුද්ධිමය හැකියාවන්ගෙන් උපරිම ඵල නෙලා ගැනීමට නම් එය දරුවාටද අවබෝධ කළ යුතුය. මෙම වයසේ දරුවන් අන් අය කරන දේ හරි ලෙස අනුකරණය කිරීමට පෙළඹේ. සමාජ නීති රීති, සම්මුති පිළිගැනීම මොනම හේතුවක් නිසාවත් වෙනස් කළ නොහැකි බව සිතා ඒ අනුව හැසිරීමට යොමු වේ. අනින් අයගේ හැසිරීම සදාචාරාත්මකව විනිශ්චය කරන විට ක්‍රියාව, ප්‍රතිඵලය පමණක් නොව චේතනාවද සලකයි. පරම්පරාවෙන් / දෙවියන් පැනවූ නීති රීති කඩ නොකළ යුතුය යන අදහසින් මිදීමට අවශ්‍ය පරිදි ඒවා වෙනස් කරයි. නීති රීති උල්ලංඝනය හැම විටම වැරදි නොවන බව සිතන්නට පෙළඹෙයි. බලධාරීන්ට යටත් වීම, කීකරු වීම, හැමවිටම අවශ්‍ය නොවන බව අදහස් කරයි. දඬුවම වරදේ ප්‍රමාණයට දිය යුතු බවත්, පාඩමක් ලෙස දිය යුතු බවත්, සිතයි.

නව යොවුන් වියේ අවශ්‍යතා වැඩිහිටියා හඳුනාගැනීම ඉතා වැදගත්ය එනම්,

ආධිපත්‍යයෙන් නිදහස් වීමේ අවශ්‍යතාව

පිළිගනු ලැබීමේ අවශ්‍යතාව

තමන් තේරුම් ගැනීමේ අවශ්‍යතාව

විරුද්ධ ලිංගික අවධානය දිනා ගැනීමේ අවශ්‍යතාව

වැඩිහිටි අවශ්‍යතාවන්ට අනුකූල වීමේ අවශ්‍යතාව

අධ්‍යාපනය ඉහළ මට්ටමෙන් පවත්වා ගැනීමේ අවශ්‍යතාව වැනිදේ වැඩිහිටියා තේරුම් ගෙන තිබීම වැදගත්ය

සම වයස් ගැහැනු ළමයකු සමඟ පාසැල් භූමිය තුළ දී කතා බහ කිරීම නිසා දඬුවම් විඳී නවයොවුන් පිරිමි ළමයකු තම මවුපියන්ට කරුණු පැහැදිලි කළේ මෙලෙසිනි. "ඔව් මම ගැහැනු ළමයෙක් එක්ක කතා කළා තමයි. පිරිමි ළමයෙක් ගැහැනු ළමයෙක් එක්ක කතා කරන එක වරදක් ද ? මම ඒ ළමයට වෙන කිසි දෙයක් කීවේ කරේ නෑ.. මම ඇහුවේ එයාගේ ආර්ථික ප්‍රශ්න ගැන. එයාට උදව්වක් කරන්න පුළුවන් නම් මම කරනවා. මට ළමයි ඉදිරිපිටදි ගහලා ඉස්කෝලෙන් අස්කරනවා කියන්න තරම් වරදක් මම කළේ නැහැ. හොඳින් ඇහුවා නම් මොනවාද කතා කළේ කියලා මම සරලව පැහැදිලි කරලා දෙනවනේ හැමදේම " මෙවැනිම හේතුවක් නිසා සිය දිවි නසා ගැනීමට තැත් කළ අවු 15 ක දැරියක් උපදේශනය සඳහා පැමිණියාය. ගුරුවර - වැඩිහිටියන් ඉදිරියේ දී නොකළ වරදකට අපහාස විඳීම දරා ගත නොහැකි නිසා ඇය සිය දිවි නසා ගැනීමට තැත් කොට තිබුණි. බුද්ධි වර්ධනය මත සදාචාර වර්ධනය සිදු වේ. එසේම සමාජමය අත්දැකීම්වල තරමද මෙහිදී වැදගත් වේ. චර්යාවක හොඳ නරක හරි වැ/ද්ද යුක්තිය අයුක්තිය සාධාරණ - අසාධාරණ බව පිළිබඳ තර්කානුකූලව අදහස් දැක්වීම සදාචාර චින්තනය ලෙස අදහස් කරයි. සම

**සම වයස් ගැහැනු ළමයකු සමඟ පාසැල් භූමිය තුළ දී කතා බහ කිරීම නිසා දඬුවම් විඳී නවයොවුන් පිරිමි ළමයකු තම මවුපියන්ට කරුණු පැහැදිලි කළේ මෙලෙසිනි. "ඔව් මම ගැහැනු ළමයෙක් එක්ක කතා කළා තමයි. පිරිමි ළමයෙක් ගැහැනු ළමයෙක් එක්ක කතා කරන එක වරදක් ද ? මම ඒ ළමයට වෙන කිසි දෙයක් කීවේ කරේ නෑ..**



වයස් කණ්ඩායම්වලින් හා සමාජයෙන් ලැබෙන අත්දැකීම් නිසා මෙවැනි චින්තනයත් හටගනී. සදචාර වර්ධනය කෙරෙහි ළමයාගේ වයස, බුද්ධි වර්ධනය, සමාජ පංතිය, පවුලේ ස්වභාවය, දෙමාපිය ආකල්ප, පවුලේ සිරිත් විරිත්, සමාජ අත්දැකීම් හා සංස්කෘතික සාධක බලපායි. ගුරුවර - මව්පිය - වැඩිහිටියන් ඔවුන්ව තේරුම් ගැනීම වැදගත් වේ. ආධිපත්‍ය ප්‍රතික්ෂේප කරයි.. අන්තර් සහයෝගය අන්‍යෝන්‍ය ගරුත්වය අපේක්ෂා කරයි කුඩා කල මෙන් නොව නිවරැද්දේ දඬුවම් ලැබූ විට ගුරු - මව්පියන්ට එරෙහිව ක්‍රියා කරයි. මෙවැනි දේ තේරුම් ගෙන මව්පිය ගුරුවර වැඩිහිටියන් ක්‍රියා කරයි නම් (යොවුන් දරුවන් අකීකරු නොහැදුනු නොහික්මුණු අය ලෙස නොතකා) ඔහුගේ ඇයගේ ගැටලු, අර්බුදකාරී තත්ත්වය මත ඇරෙයි.

## මනෝ විද්‍යාත්මක වෙනස්කම්

නව යොවුන් වියේ දී ළමා වියෙන් වැඩිහිටි වියට පා තැබීමට සූදානම් වීමක් සිදු වේ. මේ නිසා ළමා වියෙන් පැවත එන මනෝ චර්යා ලක්ෂණ සේ ම වැඩිහිටි භාවයට උචිත මනෝ චර්යා ලක්ෂණ ද දැකිය හැකි වේ. වරෙක හුදකලා බව ප්‍රිය කරන යෞවනයා තවත් අවස්ථාවක සමාජශීලි ගති පැවතුම් පෙන්වයි. තම කාමරය තුළ තනි වී ගත කරන කාලය සේ ම මිතුරු මිතුරියන් සමග විනෝද වන, කතාබහ කරන, ක්‍රීඩා කරන කාලයද ඔහුට / ඇයට එකසේ වටී. විවිධ තරග සංවිධානය,

වරෙක සතුටින් පිනා යමින් ගීතයක් මුමුණමින් සොම්නසින් සිටින යෞවනයා තවත් වරෙක මහත් දොම්නසකින් යුතුව කල්පනාකාරීව සිටිනු දැකිය හැකි වේ. යටහත් බව මෙන්ම විප්ලවීය ගති පැවතුම් ද ඇති වන්නේ මේ වයසේ දී යි. ශාරීරික සාමාජීය, චිත්තවේගීය කරුණු සම්බන්ධව අධික සවේදී බවක් පවතී.

ගමේ / නගරයේ පවතින සමාජ කටයුතුවලට නොපිරිහෙලා තම දායකත්වය සැපයීම තම යුතුකමක් කොට සලකයි. විටෙක ත්‍යාගශීලි වන නව යෞවනයා තවත් වරෙක ක්‍රියා කරන්නේ ලෝභී අත්දමිනි. කීකරු චර්යාවන් සේම අකීකරු චර්යාවන් ද වරින් වර ඔහු / ඇය තුළින් පැන නගී. වරෙක සතුටින් පිනා යමින් ගීතයක් මුමුණමින් සොම්නසින් සිටින යෞවනයා තවත් වරෙක මහත් දොම්නසකින් යුතුව කල්පනාකාරීව සිටිනු දැකිය හැකි වේ. යටහත් බව මෙන්ම විප්ලවීය ගති පැවතුම් ද ඇති වන්නේ මේ වයසේ දී යි. ශාරීරික සාමාජීය, චිත්තවේගීය කරුණු සම්බන්ධව අධික සවේදී බවක් පවතී. ස්වීයත්වය අගයයි. තම පෙනුම, අලංකාරය, සෞඛ්‍යය පිළිබඳ මහත් සේ විමසිලිමත් වෙයි. කැඩපත ඉදිරියේ ගතකරන කාලය වැඩි වන්නේ මේ නිසාය. පිරිසිදුව, පිළිවෙළට ඇඳීම, පැළඳීම මනා සෞඛ්‍ය පුරුදු පිළිපැදීම, තම පෙනුමේ අඩුපාඩු පිළිබඳ වඩාත් සැලකිලිමත් වීම කැපී පෙනෙයි. ලිංගිකතාව ගැන සංවේදී වේ. සමලිංගිකයින් (මිතුරන් / මිතුරියන් ) ඇසුරු කිරීමට පෙළඹෙන අතරම විරුද්ධලිංගික සිත් දිනාගැනීමට උත්සුක වෙයි. ඔවුන් අතර ජනප්‍රිය වීමට, කැපී පෙනීමට, සමීප ඇසුරට අවශ්‍ය ගුණාංග වර්ධනය කර ගැනීමට ඇති කුතුහලය නිසාම මානසිකව කරදර වෙයි.

මේ වයසේ දී ලිංගික පරිවර්තනය මෙන්ම ශාරීරික වර්ධනය ද සීඝ්‍රවේ. බුද්ධිමය පිබිදීම නිසා පෙරට වඩා ක්‍රියාව හා චින්තනය විධිමත් වේ. නමුත් චිත්තවේගික වර්ධනය එතරම් සීඝ්‍ර නැත. චිත්තවේග පාලනය අපහසුයි. ආතතීන් ඇති වේ. කාංසාව, පීඩනය, ව්‍යාකූල බව, නොරිස්සුම, ගැටුම්, අවුල්, මානසිකත්වය, හිරිහැරකාරී මානසිකත්වය, දැඩි පෙළීම, කනස්සල්ල, මනඃකල්පිත බිය වැනි තත්ත්ව හටගනී. මෙම වයස කුණාටු සමයක් ලෙස හඳුවන්නේ මේ නිසාය. තමාට සිදුවන කායික, ලිංගික වෙනස්කම් තේරුම් ගැනීමට තරම් චිත්තමය හැකියාවක් නොලබයි. මේ නිසා සමබර චිත්තවේග ඇතිවීමට බාධා වේ. මේ වයසේ දරුවන්ට වැඩි විය පත් වීම ප්‍රමාද

වීමේ ගැටලු, ද්විතික ලිංගිකලක්ෂණ පිළිබඳ විමතිය වැනි ගැටලු පවතී. ලජ්ජාව, කළකිරීම නිසා පවතින මානසික තැවුල් හේතුවෙන් පිටට පෙනෙන දේ වසන් කිරීමට බලයි. මව්පියන් සමග ලිංගික තොරතුරු කථා කළ නොහැකි වාතාවරණයක් සමාජයේ පවතින අතරම උපදෙස් ගැනීමට කෙනෙක් නොමැති වීමද දරුවාට ගැටලු මතුකරයි.

මනෝ විද්‍යාඥයින් පෙන්වා දෙන පරිදි යොවුන් වියේ ගැටලු බොහෝමයක් මානසික හේතුන් මත පදනම් වේ. වැඩිහිටියා, යෞවනයා ළමයෙකු වශයෙන් ද වැඩිහිටියකු වශයෙන් ද සැලකීමට කැමති නැත. වගකීම් දැරිය නොහැකි බව සිතන මව්පියන් ඔවුන් වගකීම් දැරීමෙන් වළකයි. නිදහස සීමාකර පාලනය කරයි. නීති රීති තහංචි පනවයි. දෙමාපිය, වැඩිහිටි දැඩි පාලනය යෞවනයා නුරුස්සයි. ඔවුන් ඊට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කිරීමේ මානසික ආවේග හා ආශාවන් ඇතිකර ගනී.

මේ නිසා දෙමාපිය - ගුරුවරු - වැඩිහිටියන් සමග තරගයක් ගැටීමක් ඇති කර ගනී. මෙම තත්ත්වය එළිපිට ප්‍රදර්ශනය නොවී මානසික ආතතියක් ලෙස පවතී. මෙම දැඩි පාලනය නිසා මව්පියන් බලාපොරොත්තු නොවූ අහිතකර, හානිකර, විනාශකාරී ප්‍රතිඵල ඇති විය හැකි ය. මෙහි උච්චතම අවස්ථාවේ දී එළිපිටම ගැටීමට ගනී. ප්‍රතිවිරුද්ධව කටයුතු කරයි. නිවස හැර යයි. එසේ නැතහොත් සියල්ල අභ්‍යන්තරව දරාගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මානසික රෝගී තත්ත්වයන්ටද පත් විය හැකි ය. දඩබ්බර ගති, අපචාරි තත්ත්වකරාද වර්ධනය විය හැකි ය. මනෝ වෛද්‍යවරු පවසන පරිදි යොවුන් ගැටලු තීව්‍ර ලෙස මානසික සෞඛ්‍ය කෙරෙහි බලපායි.

වයස අවු 14 ක් වූ සමන්මලී පාසලෙන් අස්කොට වෙනත් ගමක සිටින ඇගේ පුංචි අම්මාගේ නිවසේ නැවැත්වීමට දෙමාපියන්ට සිදුවී තිබුණි. ප්‍රේම සම්බන්ධතාව නතර නොකළ තම යොවුන් දියණියට පහර දී නිවසින් එළවා ඇගේ බඩු බාහිරාදිය ද විසි කළ මවටත් පියාටත් දැන් එසේ කිරීමට සිදුවී තිබුණි. ගුරු යුවලක් වූ තම මව්පියන් තම වරදට එසේ දැඩි දඬුවම් කළ නිසා නැවතත් එම ගෙදරට නොයන්නට සමන්මලී ගත් තීරණය වෙනස් ;නාකළාය. ඇය සැබවින්ම මුරණ්ඩු වී තිබුනේ දෙමාපියන් ගේ හදිසි කෝපය හා වැරදි දඬුවම් ක්‍රම නිසාවෙනි. ඇත්තෙන්ම ඇයට අවශ්‍යව තිබුනේ ආර්ථික අඟහිඟකම්වලින් පිරුණු පවුලක අයකු වන නමුත් ඉගෙනීමට දක්ෂ තම පෙම්වතාට හොඳින් ඉගෙනීමට අවශ්‍ය උදවු ලබා දීමටයි. මෙවැනි ප්‍රේම සම්බන්ධතා නව යොවුන් විය සමගම බොහෝ විට අවසන් වේ.ඔවුන් දෙදෙනාගේ නොගැලපීම, අනාගතයේ දී ඇති විය හැකි ප්‍රශ්න, මව්පියන්ගේ බලාපොරොත්තු ගැන පැහැදිලිව, නිරවුල්ව ආදරයෙන් ළංවී කියා දුන් විට යොවුන් දරුවන් එය අවබෝධ කර ගනී. යොවුන් දරුවාට කායික දඬුවම් දීමට යාමෙන් ඔවුන් වරදට පෙළඹීම ඉක්මන් වේ. මව්පියන් හා දරුවන් අතර සුහදතාව විවෘත බව කුඩා කළ සිටම වර්ධනය කර ගත යුතු බව පවසන්නේ මේ නිසාය. එසේ වූ විට යොවුන් වියේ ගැටලු ඉක්මනින් විසඳ ගත හැකිවේ.

## සංවර්ධන අවධියක් ලෙස මෙම වයසේ වැදගත්කම

සංවර්ධන අවධියක් ලෙස මෙම වයස ඉතා වැදගත්ය. යොවුන් වියේ අයකු පහත කරුණු සංවර්ධනය කරගැනීමට උත්සුක විය යුතු යැයි රොබට් හැවිග්හර්ස්ට් තම සංවර්ධන කාර්යය සංකල්පයට අනුව කියා සිටී.

ශරීරයේ පිහිටීම එලෙසින්ම පිළිගැනීම හා ශරීරය ප්‍රයෝජනවත් පරිදි භාවිතයට ගැනීම

සමවයස් ගැහැනු සහ පිරිමි කණ්ඩායම් සමග සම්බන්ධතා පවත්වාගෙන යාමට හුරුවීම

සමාජ සම්බන්ධධතා තුළින් සමාජයට යම් මෙහෙවරක් කිරීම

දෙමාපිය වැඩිහිටියන් ගේ චිත්තවේගීය ග්‍රහණයෙන් ස්වාධීනත්වය ලබාගැනීම

ආර්ථික ස්වාධීනත්වය ලබාගැනීම

කිසියම් වෘත්තියක්, නිශ්චිත චරියා හා ඇගයුම් පද්ධතියක් ඉලක්කකොට වර්ධනය වීම

සමාජමය වශයෙන් වගකිව යුතු චර්යා හා ඇගයුම් පද්ධතියක් ඉලක්ක කොට වර්ධනය2 වීම

> මනෝ විද්‍යාඥයින් පෙන්වා දෙන පරිදි යොවුන් වියේ ගැටලු බොහෝමයක් මානසික හේතුන් මත පදනම් වේ. වැඩිහිටියා, යෞවනයා ළමයෙකු වශයෙන් ද වැඩිහිටියකු වශයෙන් ද සැලකීමට කැමති නැත. වගකීම් දැරිය නොහැකි බව සිතන මව්පියන් ඔවුන් වගකීම් දැරීමෙන් වළකයි. නිදහස සීමාකර පාලනය කරයි. නීති රීති තහංචි පනවයි.

සමාජමය වශයෙන් වගකිව යුතු චර්යා සාධනය කරගැනීම හා ඊට රුචි වීම

විවාහය හෝ පවුල් ජීවිතය ඉලක්ක කොට සූදානම් වීම

මෙම අවධියේ කාර්යයන් නිසි පරිදි ඉටුවීම ඊළඟ අවධියට ගමන් කිරීම පහසු කරයි. වැඩිහිටි ජීවිතය පිළිබඳ සැලැස්මක්, සමායෝජනයක් ඇති වන්නේඑවිටය. එසේ නැතිවිට වැඩිහිටි අවධියේ දී විවිධ කරදරවලට පත් වේ.

## වෘත්තීය අපේක්ෂා

යොවුන් දරුවාට රැකියාවක අවශ්‍යතාව, කැමැත්ත හටගනී. නමුත් මෙය සමාජ පංතිය, පවුලේ ආර්ථිකය හා බැඳී පවතී. ඉහළ පංතිකයින් තුළ (මව්පියන් මෙන්ම යෞවනයන් තුළද) ඉහළ රැකියා රුචියක් පවතී. නමුත් මධ්‍යම හා කම්කරු පන්තිකයින් තුළ අනාගත වෘත්තීය පිළිබඳ අවිනිශ්චිත බව, ආර්ථික ස්වාධීනත්වය ළඟාකර ගැනීමේ අවශ්‍යතාව, දෙමාපිය වගකීමෙන් / ග්‍රහණයෙන් මිදීමේ අවශ්‍යතාව, නිසා යම් නොසුන්සුන්තාවක් පවතී. අද තාක්ෂණික දියුණුව හා සංකීර්ණ අවශ්‍යතා නිසා යෞවනයා නවත් අසීරුතාවට පත්ව ඇත. වෘත්තීය මාර්ග උපදේශනය මඟින් බුද්ධිමත් තීරණ ගැනීමට යෞවනයා පෙළඹීම ඉතා වැදගත්ය. ඉක්මනින් ධනවත් විය හැකි අඩුවෙන් ශ්‍රමය වැය කරන රැකියා (සුදු කරපට රැකියා) White Colour Jobs) සෙවීමට අද යෞවනයා තුළ පෙළඹීමක් පවතී. තම හැකියාවට හා සුදුසුකම්වලට ගැලපෙන රැකියාවලට අකමැතිවීම ද මොවුන් ගේ ලක්ෂණයකි. මෙවැන්නන් හට අර්ථවත් විනෝදංශ නොතිබීමද කැපී පෙනෙන කරුණකි.

නව යෞවනයා සහ දෙමාපියන් අතර සබඳතා විමසා බැලීමේ දී අපරදිග රටවල පාලනය නොකළ අසීමිත නිදහස නිසා හටගත් ගැටලු දැකිය හැකි අතර, පෙරදිග රටවල දැඩි සංස්කෘතික බලපෑම් අසීමිත මව්පිය පාලනය සහ රැකවරණය නිසා හටගත් ගැටලු දැකිය හැකි වේ. මෙහිදී සමාජය අපේක්ෂා කරන සාරධර්ම, සමාජ අගයන්, සම්මුති හා තහංචිවලට යෞවනයා මුහුණ දෙයි. නමුත් ඒ සියල්ල සමග තම අභියෝග සාර්ථකව ජය ගන්නා තරුණ තරුණියන් ද මේ සමාජය තුළම සිටී. එවැන්නන් දෙස මැනවින් බලන කළ පැහැදිලිව පෙනීයන කරුණක් වන්නේ ඔවුන්ව හඳුනාගත් වැඩිහිටියන් ඔවුන් සමග සිටීමයි. සමාජය නැතහොත් වැඩිහිටියා අපේක්ෂා කරන්නේ එලදයි යෞවනයකු ලොවට බිහි කිරීමට නම් මෙම කුණාටු සහිත දීර්ඝ නව යොවුන් විය පිළිබඳ වඩාත් හොඳ අවබෝධයකින් ඔවුන් ක්‍රියා කළ යුතු බව ද පැහැදිලි වෙයි. ❑